# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2101/13 - 2018 දෙසැම්බර් මස 10 වැනි සඳුදා - 2018.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන වගන්තිය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: MLB/LND/LNDAQ/L1/47.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2016/LO/541.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාලිම්බඩ ගමේ මු.පි.මාර/2752 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාලිම්බඩ පොලිස් ස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගෙන තිබේ.

*උපලේඛනය*

කැබලි අංක 01

ඉඩමේ නම: දන්ගහදෙනිය; ඉඩමේ විස්තරය: කුඹුර; ඉඩමේ මුල් හිමිකම් කියන්නා: පාලටුව, මාලිම්බඩ ඉදුරුකාව විහාරයේ විහාරාධිපති පූජ්‍ය මාලිම්බඩ යසස්සි හිමි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0650.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 27 වන දින පෙ.ව. 10.30ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය. තව ද 2018 දෙසැම්බර් මස 20 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-714

ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: NWG/LND/1/ACQUI/5/4516/09.

ඉගිනිමිටිය ජලාශ යෝජනා ක්‍රමයට ඉඩම් අත්පත් කර ගැනීමෙන් අනතුරුව හිමිකරුවන් වෙත වන්දි ලබා දීමේ කටයුතු සඳහා පනතේ 07 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන ලද 1269/1 අංක දරන 2002.12.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් වූ හමංගල්ල ගමෙහි පිහිටි අ.ග.පි. 3219 පිඹුරේ කැබලි අංක 265හි සඳහන් ප්‍රමාණය වන හෙක්ටයාර් 0.019ක් යන්න හෙක්ටයාර් 0.074ක් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

හර්ෂන ජයසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 715

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.